# ආර්ථික හා සමාජ පිරිවැය

## බලශක්තිය

1992 වර්ෂයේ මුල් සිවුමස තුළ නොකඩවා පැවති නියඟය හේතුවෙන් බලශක්ති අංශය දැඩි පසුබෑමකට ලක් වුවද, වසරේ පසු භාගයේදී තත්ත්වය වඩා යහපත් අතට හැරුණි. වසරේ ප්‍රථම භාගය තුළදී තියුණු ලෙස පහත වැටුණු ජල විදුලිය බල උත්පාදනය, කාලගුණික තත්ත්වය නැවත යහපත් වීමත් සමඟම බෙහෙවින් සතුටුදායක අතට හැරුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස වසරේ පසු භාගයේදී තාප බල උත්පාදනය මත රඳා පැවැත්ම, ඉතා සුළු ප්‍රමාණයක් දක්වා අඩු කර ගැනීමට ලංකා විදුලි බල මණ්ඩලය (ලං.වි.ම.) ට හැකිවිය. විදුලිය බල සැපයුම් ක්‍රියාවලියට මෙබඳු බාධා පැවැතියද, සලකා බලන වසර තුළදී විදුලිය බල ඉල්ලුම තවදුරටත් වර්ධනය විය. මේ අතර තාප බල උත්පාදනය හේතුවෙන් ජනිත වූ බැර ඩීසල් සහ දැවි තෙල් සඳහා වූ ඉල්ලුමේ තියුණු ඉහළ යාම වසරේ පසු භාගයේදී බෙහෙවින් අඩුවිය. කෙසේ වෙතත්, සුදු ඩීසල් සහ සුපිරි ඩීසල්වල පැවති සාපේක්ෂ මිළ වාසිය හේතුකොටගෙන මෙම නිෂ්පාදනයන්ගේ දේශීය පරිභෝජනය තවදුරටත් වැඩිවිය.

දර, කෘෂිකාර්මික අපද්‍රව්‍ය, සත්ත්ව අපද්‍රව්‍ය සහ වෙනත් ශාඛා අපද්‍රව්‍ය වලින් සමන්විත වාණිජ නොවන බලශක්ති මූලාශ්‍රය ප්‍රධානතම බලශක්ති මූලාශ්‍රය වශයෙන් තවදුරටත් පැවතුණි. ඛනිජ තෙල් ටොන් සමක දශ ලක්ෂ 4.9 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති මෙම බලශක්ති මූලාශ්‍රය දිවයිනේ මුළු බලශක්ති සැපයුමෙන් සියයට 69 ක් නියෝජනය කල අතර, ඉතිරිය ඛනිජ තෙල්, විදුලිය බලය සහ ද්‍රව ඛනිජ වායු වලින් සමන්විත විය.

1992 වසරේ අවසාන කාලයේදී සමනල වැව ජල විදුලිය බල ව්‍යාපෘතිය ආරම්භ වීමත් සමඟම, ජල විදුලිය බල ස්ථාපිත ධාරිතාවය වසර තුළදී, මෙගවොට් 1,137 දක්වා මෙගවොට් 120 කින් වැඩිවිය. මේ අතර, තාප බල ස්ථාපිත ධාරිතාවය 1992 දී මෙගවොට් 272 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. මේ අනුව, විදුලිය බල උත්පාදනයේ මුළු ස්ථාපිත ධාරිතාවය 1992 දී මෙගවොට් 1,410 දක්වා මෙගවොට් 120 කින් වැඩිවිය.

1992 දී ලං.වි.ම. විසින් උත්පාදනය කරන ලද මුළු විදුලිය බල ප්‍රමාණය ගිගවොට් පැය 3,540 ක් විය. පසුගිය වසරේ වූ සියයට 7 ක වැඩිවීම හා සසඳන කල මෙය සියයට 5 ක වැඩිවීමකි. සියයට 7 ක අඩුවීමක් වාර්තා කරමින් 1992 දි මුළු ජල විදුලිය බල උත්පාදනය ගිගවොට් පැය 2,900 ක්ව පැවතුණි. මෙයට ප්‍රධාන හේතුව වූයේ විදුලි බලාගාර ආශ්‍රිත ජලාශයන්හි පැවති ජල මට්ටම් ඉතා සීඝ්‍ර අන්දමින් පහල බැස යාම නිසා වසරේ ප්‍රථම මාස හය තුළ ජල විදුලිය බල උත්පාදනය සියයට 31 කින් තියුණු ලෙස පහත වැටීමයි. මේ හේතුවෙන් 1991 දී ගිගවොට් පැය 260 ක්ව පැවති තාප බල උත්පාදනය 1992 දී ගිගවොට් පැය 640 දක්වා සැලකිය යුතු ලෙස වැඩිවිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 1991 දී රුපියල් දශ ලක්ෂ 459 වූ විදුලිය බල උත්පාදනයේදී දැරීමට සිදු වූ ඉන්ධන වියදම සලකා බලන වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 1,657 දක්වා වැඩිවිය. මේ අතර 1991 දී සියයට 18.8 ක් වූ විදුලිය බල උත්පාදනයේදී හා බෙදා හැරීමේදී සිදු වූ පාඩුව 1992 දී සියයට 17.6 දක්වා අඩුවිය.

වසර තුළදී විදුලිය බල ගාස්තු ව්‍යුහයේ වෙනසක් සිදු නොවුවද, විදුලිය බල උත්පාදනයේදී දැරීමට සිදු වූ අධික පිරිවැය නිසා 1992 මාර්තු මස සිට බල පැවැත්වෙන පරිදි සියයට 25 ක ඉන්ධන ගැලපුම් ගාස්තුවක් හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත් පිළිවෙලින් ඒකක 50 කට හෝ ඒකක 150 කට අඩුවෙන් පරිභෝජනය කරන ගෘහස්ථ පාරිභෝගිකයන් හා ආගමික සංවිධානයන් මෙම ගාස්තුවෙන් නිදහස් කෙරුණි. තවද විදුලිය බල පරිභෝජනය අඩු කිරීම පිණිස 1992 අප්‍රියෙල් - මැයි කාලසීමාව තුළදී ලං.වි.ම. විසින් දිවයින පුරා බලපැවැත්වෙන පරිදි විදුලිය බලය කපා හැරීමක් සිදු කරනු ලැබිණි. මෙබඳු ක්‍රියාමාර්ගයන් මධ්‍යයේ වුවද, විදුලිය අලෙවිය පසුගිය වසරට වඩා සියයට 6 කින් වැඩිවී ගිගවොට් පැය 2,915 ක් විය. ගෘහස්ථ අංශය සඳහා වූ විකුණුම් සියයට 8 කින් වැඩිවී ගිගවොට් පැය 696 ක් විය. මෙයට විශාල වශයෙන් හේතු වූයේ ග්‍රාමීය විදුලිය බල යෝජනා ක්‍රම තවදුරටත්

## 1.25 සංඛ්‍යා සටහන
## බලශක්ති අංශයේ මූලික ලක්ෂන 1991 - 1992

| ශීර්ෂය | ඒකක | 1991 | 1990 ට වඩා ප්‍රතිශත වෙනස | 1992* | 1991 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1. ඛනිජ තෙල් නිෂ්පාදන | | | | | |
| 1.1 අපනයන කළ ප්‍රමාණය | මෙ. ටො. | 523,211 | -15.7 | 410,164 | -21.6 |
| 1.2 අපනයන වටිනාකම | රු. ද. ල. | 3,289.4 | -17.2 | 2,770.6 | -15.8 |
| | විගැහි ද. ල. | 58.1 | -20.4 | 44.9 | -22.7 |
| 1.3 ආනයන කළ ප්‍රමාණය | | | | | |
| 1.3.1 බොර තෙල් | මෙ. ටො. | 1,625,522 | -8.6 | 1,296,518 | -20.2 |
| 1.3.2 පිරිපහදු නිෂ්පාදන | " | 218,537 | 74.8 | 661,513 | 202.7 |
| 1.3.3 එල්.පී. ගෑස් | " | 18,312 | 8.3 | 31,383 | 71.4 |
| 1.4 ආනයන වටිනාකම (පි.ස.ගැ) | | | | | |
| 1.4.1 බොර තෙල් | රු. ද. ල. | 9,667.14 | -22.1 | 7,666.70 | -20.7 |
| | විගැහි ද. ල. | 170.77 | -25.1 | 124.16 | -27.3 |
| 1.4.2 පිරිපහදු නිෂ්පාදන | රු. ද. ල. | 2,566.78 | 124.0 | 5,526.41 | 115.3 |
| | විගැහි ද. ල. | 45.34 | 116.4 | 89.50 | 97.4 |
| 1.4.3 එල්. පී. ගෑස් | රු. ද. ල. | 239.35 | 13.8 | 404.11 | 68.8 |
| | විගැහි ද. ල. | 4.23 | 9.6 | 6.54 | 54.7 |
| 1.5 බොර තෙල් බැරලයක සාමාන්‍ය මිල (පි.ස.ගැ.) | රුපියල් | 806.76 | -14.4 | 803.00 | -0.5 |
| | එ. ජ. ඩොලර් | 19.50 | -17.1 | 18.32 | -6.0 |
| 1.6 දේශීය අලෙවිය | මෙ. ටො. | 1,240,494 | 7.7 | 1,486,844 | 19.9 |
| 1.6.1 පෙට්‍රල් | " | 159,765 | -10.7 | 164,875 | 3.2 |
| 1.6.2 ඔටෝ ඩීසල් | " | 539,983 | 5.3 | 606,527 | 12.3 |
| 1.6.3 බැර ඩීසල් | " | 32,528 | 62.0 | 125,274 | 285.1 |
| 1.6.4 සුපිරි ඩීසල් | " | 19,989 | 19.8 | 22,722 | 13.7 |
| 1.6.5 භූමිතෙල් | " | 173,425 | 3.7 | 189,363 | 9.2 |
| 1.6.6 දැවි තෙල් | " | 204,356 | 27.4 | 251,689 | 23.2 |
| 1.6.7. ගුවන්යානා ඉන්ධන | " | 72,715 | 19.0 | 81,513 | 12.1 |
| 1.6.8 ගුවන්යානා ගැසොලින් | " | 211 | -12.8 | 188 | -10.9 |
| 1.6.9 එල්.පී.ගෑස් | " | 37,522 | 10.2 | 44,693 | 19.1 |
| 1.7 දේශීය මිල | | | | | |
| 1.7.1 පෙට්‍රල් | රු./ලීටර | 30.00 | - | 33.00 | 10.0 |
| 1.7.2 ඔටෝ ඩීසල් | " | 11.00 | - | 11.65 | 5.9 |
| 1.7.3 බැර ඩීසල් | " | 10.60 | - | 11.15 | 5.2 |
| 1.7.4 සුපිරි ඩීසල් | " | 13.00 | - | 14.55 | 11.9 |
| 1.7.5 භූමිතෙල් | " | 8.80 | - | 8.80 | 0.0 |
| 1.7.6 දැවි තෙල් | " | | | | |
| 500 | " | 6.55 | -0.8 | 7.10 | 9.5 |
| 800 | " | 6.25 | -0.8 | 6.80 | 8.8 |
| 1000 | " | 5.95 | -0.8 | 6.50 | 9.2 |
| 1.7.7 තාර | " | 10.90 | -0.9 | 15.15 | 39.0 |
| 1.7.8 එල්.පී.ගෑස් | රු/කි.ග්‍රෑ. | 16.54 | - | 16.54 | 0 |
| 2. විදුලිය බලය | | | | | |
| 2.1 ස්ථාපිත ධාරිතාව | මෙගවොට් | 1,289.65 | - | 1,409.65 | 9.3 |
| 2.1.1 ජලබලය | " | 1,017.45 | - | 1,137.45 | 11.8 |
| 2.1.2 තාප බලය | " | 272.20 | - | 272.20 | - |
| 2.2 ජනනය කළ ඒකක | ගිග.වොට් පැ. | 3,376.6 | 7.2 | 3,539.9 | 4.8 |
| 2.2.1 ජල බලය | " | 3,116.2 | -0.9 | 2,900.1 | -6.9 |
| 2.2.2 තාප බලය | " | 260.4 | 5,005.9 | 639.8 | 145.7 |
| 2.3 මුළු අලෙවිය | " | 2,742.4 | 5.1 | 2,915.0 | 6.3 |
| 2.3.1 ගෘහස්ථ | " | 643.6 | 25.1 | 695.5 | 8.1 |
| 2.3.2 කාර්මික | " | 958.2 | 5.3 | 1,047.4 | 9.3 |
| 2.3.3 වාණිජ | " | 547.4 | 7.5 | 589.1 | 7.6 |
| 2.3.4 පලාත් පාලන ආයතන | " | 571.7 | 13.0 | 554.4 | -3.0 |
| 2.3.5 වීදි ආලෝක කිරීම | " | 21.5 | 20.1 | 28.6 | 33.0 |

* තාවකාලිකයි

මූලයන් : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය සහ කොළඹ ගෑස් සමාගම (සීමිත).

පුළුල් වීමත් සමඟම ගෘහස්ථ පාරිභෝගික සංඛ්‍යාව 1991 දී 7,51,614 සිට 1992 දී 8,97,542 දක්වා වැඩි වීමයි. මේ අතර, සලකා බලන වර්ෂය තුළදී කාර්මික සහ වානිජ කටයුතුවල පුළුල්වීමක් පිළිබිඹු කරමින් කාර්මික හා වානිජ අංශවලට කෙරුණු විදුලිය අලෙවිය පිළිවෙලින් සියයට 9 ක් සහ සියයට 8 කින් වැඩිවිය. කෙසේ වෙතත් පලාත් පාලන ආයතනවලට කල විදුලිය තොග අලෙවිය 1992 දී සියයට 3 කින් අඩුවිය.

ඛනිජ තෙල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන සඳහා මුළු වියදම වූ රුපියල් දශ ලක්ෂ 13,938 ඉකුත් වසරට වඩා සියයට 8 ක වැඩිවීමකි. බොර තෙල් බැරලයක සාමාන්‍ය මිළ 1991 දී ඇමරිකන් ඩොලර් 19.50 (රුපියල් 807) සිට 1992 දී ඇමරිකන් ඩොලර් 18.32 (රුපියල් 803) දක්වා පහත වැටුණි. මේ අතර, ඛනිජ තෙල් ආනයන පරිමාව 1991 දී මෙට්‍රික් ටොන් 16,25,522 සිට 1992 දී 12,96,518 දක්වා සියයට 20 කින් පහත වැටුණි. මෙයට ප්‍රධාන හේතුව වූයේ 1992 ජුනි මස සිට සැප්තැම්බර් දක්වා පිරිපහදු කම්හලේ බොර තෙල් පිරිපහදු ඒකකය නවීකරණය කිරීම සඳහා වසා තැබීමයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ආනයනය කරන ලද පිරිපහදු කල ඛනිජ තෙල් නිෂ්පාදිත ප්‍රමාණය 1991 දී මෙට්‍රික් ටොන් 2,18,537 සිට 1992 දී මෙට්‍රික් ටොන් 6,61,513 දක්වා තෙගුණයකින් වැඩිවිය. මේ අතර කොළඹ ගෑස් සමාගම විසින් ආනයනය කරන ලද ද්‍රව ඛනිජ වායු (එල්.පී.ගෑස්) පරිමාව වසර තුළදී මෙට්‍රික් ටොන් 31,383 දක්වා මෙට්‍රික් ටොන් 13,071 කින් වැඩිවිය. මේ අනුව එල්.පී.ගෑස් ආනයන වටිනාකම 1992 දී රුපියල් දශ ලක්ෂ 404 දක්වා සියයට 69 කින් වැඩිවිය.

1992 දී දේශීය ඛනිජ තෙල් නිෂ්පාදිත පරිභෝජනය මෙට්‍රික් ටොන් 14,86,844 ක් විය. පසුගිය වසරේ වූ සියයට 8 ක වැඩිවීම හා සසඳන කල මෙය සියයට 20 ක වැඩිවීමකි. ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වූ ඉල්ලුමේ ඇති වූ මෙම විශාල වැඩිවීමට හේතු වූයේ ලං.වි.ම. විසින් තාප විදුලිය බල උත්පාදනය සඳහා බැර ඩීසල් හා දැවි තෙල් විශාල වශයෙන් උපයෝගී කර ගැනීමය. බැර ඩීසල් සඳහා වූ ඉල්ලුම 1991 දී මෙට්‍රික් ටොන් 32,528 සිට 1992 දී මෙට්‍රික් ටොන් 1,25,274 දක්වා ඉහළ ගිය අතර දැවි තෙල් පරිභෝජනය මෙම වසර දෙක තුළදී මෙට්‍රික් ටොන් 2,04,356 සිට මෙට්‍රික් ටොන් 2,51,689 දක්වා වැඩිවිය. මිලෙහි සියයට 6 ක වැඩිවීමක් පැවතුනද, සුදු ඩීසල් සඳහා වූ ඉල්ලුම වසර තුළදී මෙට්‍රික් ටොන් 6,06,527 දක්වා සියයට 12 කින් වැඩිවිය. සියයට 10 කින් මිළ ඉහළ නැඟුනද සුපිරි පෙට්‍රල් සඳහා වූ ඉල්ලුම 1992 දී මෙට්‍රික් ටොන් 1,64,875 දක්වා සියයට 3 කින් වැඩිවිය. සලකා බලන කාලපරිච්ඡේදය තුළදී භූමිතෙල් පරිභෝජනය මෙට්‍රික් ටොන් 1,89,363 දක්වා සියයට 9 කින් ඉහළ නැගුණි. මේ අතර, ආහාර පිසීමේ කටයුතු සඳහා එල්.පී.ගෑස් භාවිතය ඉහළයාම පිළිබිඹු කරමින් එල්.පී.ගෑස් සඳහා වූ ඉල්ලුම 1992 දී මෙට්‍රික් ටොන් 44,693 දක්වා සියයට 19 ක සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවිය.

### ගමනාගමනය

1992 වර්ෂයේදී ගමනාගමන අංශයට අදාල විවිධ උප අංශයන්හී කටයුතුවල මිශ්‍ර ප්‍රතිඵල වාර්තා විණි. විමසුමට ලක්වන වර්ෂය තුළදී ජනතා සන්තක බස් සමාගම්වල ධාවන කටයුතු තවදුරටත් වර්ධනය වූ අතර, පෞද්ගලික අංශයේ මගී ප්‍රවාහන සේවා කටයුතුද පුළුල් විය. කෙසේ වුවද, 1992 දී ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (ශ්‍රී ලං.දු.) කටයුතුවල සුළු පහත බැසීමක් වාර්තා කෙරිණි.

1990 දෙසැම්බර් මස ආරම්භ කරන ලද ජනතාකරණ වැඩපිළිවෙල යටතේ 1992 වසරේ අවසානය වන විට බස් සමාගම් 87 ක් පිහිටුවන ලදී. එමෙන්ම 1992 වර්ෂය අවසානය වනවිට ජනතාසන්තක සමාගම් සතුව පැවති බස් රථ ඇනියට බස් රථ 425 ක් අලුතින් ඇතුලත් කරන ලද අතර, බස් රථ 1,600 ක් ලෝකබැංකු ආධාර ක්‍රමය යටතේ අළුත්වැඩියා කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ජනතාසන්තක බස් සමාගම් විසින් දිනකදී ධාවනය කරන ලද සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව 1991 දී 3,359 සිට 1992 දී 3,550 දක්වා වැඩිවිය. මේ හේතුවෙන් ජනතාසන්තක සමාගම්වල ධාවන කිලෝමීටර් ප්‍රමාණය සියයට 9 කින් වැඩිවී දශ ලක්ෂ 268 ක් විය. එමෙන්ම පසුගිය වර්ෂයේ සියයට 14 කින්

**1.26 සංඛ්‍යා සටහන**
**ගමනා ගමන අංශයේ මූලික ලක්ෂණ 1991 - 1992**

| ශීර්ෂය | ඒකකය | 1991 | 1990 ට වඩා ප්‍රතිශත වෙනස | 1992* | 1991 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1. මෝටර් රථ නව ලියාපදිංචි කිරීම් | | | | | |
| 1.1 ජනතාසන්තක සමාගම් යටතේ බස් රථ | සංඛ්‍යාව | 189 | 142.3 | 30 | -84.1 |
| 1.2 පෞද්ගලික මගී ප්‍රවාහන බස් රථ | " | 2,987 | 178.9 | 2,449 | -18.0 |
| 1.3 පෞද්ගලික මෝටර් රථ ** | " | 15,076 | -0.4 | 20,178 | 33.8 |
| 1.4 මෝටර් බයිසිකල් | " | 58,643 | -30.5 | 65,834 | 12.3 |
| 1.5 භාණ්ඩ ප්‍රවාහන වාහන | " | 3,200 | 15.3 | 4,146 | 29.6 |
| 1.6 ඉඩම් වාහන | " | 4,003 | 49.8 | 5,487 | 37.1 |
| 1.7 වෙනත් | " | 76 | 28.8 | 134 | 76.3 |
| 1.8 පෞද්ගලික බස් රථ | " | 272 | 209.1 | 425 | 56.3 |
| 2. ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී ලං.දු.සේ.) | | | | | |
| 2.1 ධාවන කිලෝමීටර් | දශ ලක්ෂ | 7.6 | 4.1 | 7.5 | -1.3 |
| 2.2 මගී කිලෝමීටර් | " | 2,653.4 | -4.6 | 2,633.7 | -1.0 |
| 2.3 බඩු ටොන් කිලෝමීටර් | " | 169.1 | 3.2 | 173.2 | 2.4 |
| 2.4 මුළු ආදායම | රු. දශ ලක්ෂ | 808 | 18.8 | 871 | 7.8 |
| 2.5 මුළු වියදම | " | 1199 | 13.4 | 1,211 | 1.0 |
| 2.6 අතිරික්තය (+) හිඟය (-) | " | -391 | 18.0 | -340 | 13.0 |
| 3. ජනතා සන්තක ප්‍රවාහන සමාගම් | | | | | |
| 3.1 ධාවන කිලෝමීටර් | දශ ලක්ෂ | 247.0 | 0.7 | 268.1 | 8.5 |
| 3.2 මගී කිලෝමීටර් | " | 11,454.0 | -14.1 | 12,840.0 | 12.1 |
| 3.3 මුළු ආදායම | රු. දශ ලක්ෂ | 2,761.0 | 5.5 | 3,106.0 | 12.5 |

* තාවකාලික
** ද්විත්ව කාර්ය වාහන ද ඇතුලත් වේ

මූලයන් : ශ්‍රී ලංකා දුම්රිය සේවය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, සහ ජාතික ප්‍රවාහන කොමිසම.

පහත බැස තිබූ මගී කිලෝමීටර් ප්‍රමාණය 1992 වර්ෂයේදී ඊට ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් පෙන්නුම් කරමින් සියයට 12 කින් වැඩිවී දශ ලක්ෂ 12,840 ක් බවට පත්විය. මේ හේතුව නිසා ජනතාසන්තක සමාගම්වල මුළු ආදායම 1991 දී රුපියල් දශ ලක්ෂ 2,761 සිට 1992 දී රුපියල් දශ ලක්ෂ 3,106 දක්වා සියයට 13 කින් වැඩිවිය.

1992 වර්ෂය තුළ ශ්‍රී ලං.දු. සේවයෙහි ධාවන කිලෝමීටර් ප්‍රමාණය දශලක්ෂ 7.5 දක්වා ඉතා සුළු ප්‍රමාණයකින් අඩුවිය. මීට සමානව මගී කිලෝමීටර් ප්‍රමාණයද ඉතා සුළු අඩුවීමක් පෙන්නුම් කරමින් කිලෝමීටර් දශ ලක්ෂ 2,634 ලෙස වාර්තා විණි. කෙසේ වුවද, බඩුටොන් කිලෝ මීටර් ප්‍රමාණයෙන් පෙන්නුම් කරන ලද පරිදි භාණ්ඩ ප්‍රවාහන සේවය පසුගිය වර්ෂයට වඩා සියයට 2 කින් වැඩිවී 1992 දී දශලක්ෂ 173 ක් විය. ශ්‍රී ලං.දු. සේවයේ ධාවන සහ මගී කිලෝමීටර් ප්‍රමාණයන් අඩුවීමට විශාල වශයෙන් හේතු වූයේ වටවලදී දුම්රිය මාර්ගය නාය යෑම හේතුවෙන් 1992 ජූලි මස සිට ප්‍රධාන මාර්ගයේ දුම්රිය ධාවනයට බාධා පැමිණීමය. මීට අමතරව පසුගිය වසරේ මෙන්ම උතුරු සහ නැගෙනහිර පලාත්වල පැවති අභ්‍යන්තර කළබල නිසා එම පලාත්වල දුම්රිය සේවාව සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට අපහසු විය. කෙසේ වුවද, ශ්‍රී ලං.දු. සේවයේ ධාවන කටයුතුවල පහළ බැසීම නිසා ඇතිවූ අහිතකර බලපෑම, දිවයිනේ අනෙකුත් ප්‍රදේශයන්හි ධාවන කටයුතුවල ඇතිවූ වර්ධනය මගින් තරමක් දුරට සමහන් විය. දුර ගමන් සේවා සඳහා සුඛෝපභෝගී දුම්රිය මැදිරි යෙදවීම, අනුරාධපුරය සහ

මහනුවර සිට මාතර දක්වා අඛණ්ඩ දුම්රිය සේවාවන් ඇති කිරීම, නගරාසන්න ප්‍රදේශවල නව දුම්රිය බලවේග කට්ටල යෙදවීම සහ මරදාන සිට නුගේගොඩ දක්වා කැළණිවැලි දුම්රිය මාර්ගය පුළුල් කිරීම වැනි කටයුතු 1992 වර්ෂය තුළ දුම්රිය සේවයේ වර්ධනයට සාධක වූ හේතූන්ය. මේ අතර වර්ෂය තුළදී සිමෙන්ති සහ පිටි ප්‍රවාහනයේ වර්ධනයක්ද සිදු විය.

මෙම සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලං.දු. සේවයේ මුළු ආදායම රුපියල් දශ ලක්ෂ 871 දක්වා වැඩිවී පසුගිය වසරට වඩා සියයට 8 කින් ඉහළ ගියේය. මේ අතර මුළු වියදම සුළු වශයෙන් වැඩිවී රුපියල් දශ 1,211 ක් විය. මෙම ආදායම් හා වියදම් ප්‍රවාහයන් පිළිබිඹු කරමින් ශ්‍රී.ලං.දු. සේවයේ මෙහෙයුම් අලාභය 1991 දී රුපියල් දශ ලක්ෂ 391 සිට 1992 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 340 දක්වා අඩුවිය.

1992 වර්ෂයේදී පෞද්ගලික අංශයේ මගී ප්‍රවාහන සේවාව තවදුරටත් වර්ධනය විය. මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ අළුතෙන් ලියාපදිංචි කරණ ලද මගී ප්‍රවාහන බස් රථ සංඛ්‍යාව 1992 වසර තුළදී 2449 ක් විය. මේ අතර උතුරු සහ නැගෙනහිර පලාත් සභා හැර ඉතිරි පලාත් සභා 7 මගින් අළුතින් මාර්ග බලපත් 3,253 ක් පෞද්ගලික අංශයේ ධාවකයින් වෙත වර්ෂය තුළදී නිකුත් කරන ලදී. ජාතික සංවර්ධන බැංකුවෙහි (ජා.සං.බැං.) බස් රථ මිලදී ගැනීම සඳහා වූ ණය ක්‍රමය යටතේ ණය පහසුකම් සැපයීම, පෞද්ගලික අංශයේ ප්‍රවාහන සේවා කටයුතු තවදුරටත් පුළුල් වීමට හේතු විය. 1992 වසර අවසාන වනවිට මෙම ණය ක්‍රමය යටතේ වූ ණය පහසුකම් මුළුමනින්ම ප්‍රයෝජනයට ගෙන තිබුණු අතර, මෙම ණය ක්‍රමය යටතේ 1992 වර්ෂය අවසාන වනවිට බස්රථ 1,911 ක් මිලදී ගැනීම සඳහා ණය ඉල්ලුම්පත් 1,816 කට ණය මුදල් මුදා හරින ලදී. තවද, 1992 ජනවාරි මස සිට ක්‍රියාත්මක වූ ජා.සං.බැ. හි දුමක iv ණය ක්‍රමය යටතේ බස් රථ මිලදී ගැනීම සඳහා ණය ඉල්ලුම්පත් 94 ක් අනුමත කර තිබුණි.

## නිවාස ඉදිකිරීම්

පසුගිය වසරට වඩා සැලකියයුතු ප්‍රගතියක් වාර්තා කරමින් නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහන 1992 දී එහි තුන්වන වසර සම්පූර්ණ කළේය. මෙම වැඩසටහන යටතේ වසර හයක් ඇතුළත පවුල් ලක්ෂ 15 කට නව නිවාස තැනීම, පවතින නිවාසවල තත්ත්වය ඉහළ නැංවීම සහ දුප්පත් ජනතාවගේ නිවාස වැඩිදියුණු කිරීම සඳහා ණය හා ආධාර සැපයීම පිණිස උප-වැඩසටහන් දහයක් ක්‍රියාත්මක වේ.*

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, සෘජු සහභාගිත්වයක් දැරූ ග්‍රාමීය නිවාස උප-වැඩසටහන සහ නාගරික නිවාස උප-වැඩසටහන 1992 දී ඉහළ මට්ටමක ප්‍රගතියක් පෙන්නුම් කළේය. නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහනේ විශාලතම යෝජනාක්‍රමය වන ග්‍රාමීය නිවාස උප-වැඩසටහන යටතේ 1992 දී පවුල් 38,457 ක් සඳහා රුපියල් දශලක්ෂ 259 ක් ණය සැපයූ අතර, මෙයින් නිවාස 23,022 ක වැඩ කටයුතු නිමාවට පත් කරන ලදී. නාගරික නිවාස උප-වැඩසටහන යටතේ අඩු ආදායම් පවුල්වල නිවාස තත්ත්වය දියුණු කිරීම සඳහා අඩු ආදායම් පවුල් 6,016 කට රුපියල් දශ ලක්ෂ 53 ක ණය පහසුකම් ලබා දෙන ලදී. තවද, 1992 දී මෙම වැඩසටහන නාගරික අංශයේ ඉහළ මධ්‍යම පන්තික පවුල්වලට අදාල වන පරිදි පුළුල් කරන ලදී. ඒ අනුව නාගරික (විශේෂ) මධ්‍යම අදායම් පවුල් උපවැඩසටහන යටතේ කොළඹ නගරය සහ ඒ අවට නිවාස ඒකක 590 ක් තනා නිම කරන ලදී. මේ යටතේ සපයන ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 212 ක් විය.

සලකා බලන වර්ෂය තුළ ආපදා නිවාස උප-වැඩසටහන කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. මේ යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් පවුල් 17,014 කට රුපියල් දශ ලක්ෂ 159 ක ණය මුදල් ලබා දෙන ලදී. වර්ෂය තුළ නිම කරන ලද නිවාස ප්‍රමාණය 10,443 ක් වූ අතර, එය වසර සඳහා වූ ඉලක්කය ඉක්මවීමකි.

---

* උප-වැඩසටහන් දහය නම්, ග්‍රාමීය නිවාස උප-වැඩසටහන, නාගරික නිවාස උප-වැඩසටහන, ආපදා නිවාස උප-වැඩසටහන, පලාත් සභා නිවාස උප-වැඩසටහන, මහවැලි නිවාස උප-වැඩසටහන, වතුකරයේ නිවාස උප-වැඩසටහන, සමූපකාර නිවාස උප-වැඩසටහන, සේවක නිවාස උප-වැඩසටහන, පුද්ගලික නිවාස උප-වැඩසටහන, පුද්ගලික ආයෝජනයන්ගේ නිවාස උප-වැඩසටහන.

## 1.27 සංඛ්‍යා සටහන

### නිවාස 15 ලක්ෂයේ වැඩ සටහනෙහි ක්‍රියාකාරිත්වය 1990 - 1992

| උප-වැඩසටහන | ණය ලබාගත් පවුල් ගණන | | | නිම කළ ඒකක ගණන | | | මුදා හරින ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1992(අ) | 1990 | 1991 | 1992(අ) | 1990 | 1991 | 1992(අ) |
| ග්‍රාමීය නිවාස උප-වැඩසටහන | 26,157 | 30,434 | 38,457 | 13,656 | 24,659 | 23,022 | 157.0 | 245.5 | 258.5 |
| නාගරික නිවාස උප-වැඩසටහන | | | | | | | | | |
| අඩු ආදායම් ලබන පවුල් | 5,377 | 5,808 | 6,016 | 2,954 | 5,627 | 3,509 | 32.6 | 50.3 | 53.1 |
| විශේෂ නාගරික මධ්‍යම ආදායම් ලබන පවුල් | - | 16 | 590 | - | 16 | 590 | - | 222.7 | 211.9 |
| පලාත් සභා නිවාස උප-වැඩසටහන | 1,070 | 1,422 | 2,013 | 128 | 1,160 | 955 | 3.9 | 10.0 | 12.0 |
| ආපදා නිවාස උප-වැඩසටහන | 9,727 | 14,002 | 17,014 | 3,142 | 5,197 | 10,443 | 77.5 | 143.5 | 159.0 |
| වතුකරයේ නිවාස උප-වැඩසටහන (ආ) | 121 | 313 | 228 | 121 | 313 | 228 | - | - | - |
| මහවැලි නිවාස උප-වැඩසටහන | 9,751 | 4,721 | 3,505 | 4,129(ඇ) | 3,714(ඇ) | 5,968(ඇ) | 31.1(ඇ) | 15.8(ඇ) | 17.2(ඇ) |
| සේවක නිවාස උප-වැඩසටහන | 1,644 | 1,214 | 249(ඉ) | 130 | 145 | - | 34.7 | 260.5 | 3.6(ඉ) |
| මුළු ගණන | 53,847 | 57,930 | 68,072 | 24,260 | 40,831 | 44,715 | 336.8 | 948.3 | 715.3 |

(අ) තාවකාලික
(ආ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයසහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පමණි.
(ඇ) මහවැලි ආර්ථික ඒජන්සිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ සහ උප පවුල් විසින් නිම කරන ලද නිවාස. යුරෝපා ආර්ථික කොමිසම මගින් නිම කරන ලද නිවාසද 1990 සහ 1991 වර්ෂවලට ඇතුළත් වී ඇත.
(ඇ) මහවැලි ආර්ථික ඒජන්සිය මගින් නව පදිංචිකරුවන් සඳහා කරන ලද ප්‍රදානයන්.
(ඉ) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පමණි.

මූලයන්: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, මහවැලි ආර්ථික ඒජන්සිය, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජනවසම) හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව නියෝජනය කරන වැවිලි නිවාස උප-වැඩසටහන වර්ෂය තුළ සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කළේය. ජනවසම නව නිවාස ඒකක 166 ක් නිම කිරීමටත් නිවාස 461 ක තත්ත්වය උසස් කිරීමටත් සමත් වූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව නව නිවාස 62 ක් නිම කිරීමටත් නිවාස 1,494 ක තත්ත්වය උසස් කිරීමටත් සමත් විය. තවද, වර්ෂය තුළදී ජනවසමට අයත් නිවාස 3,739 කට සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් නිවාස 979 කට වැසිකිළි පහසුකම් සපයන ලදී. මහවැලි ආර්ථික ඒජන්සිය යටතේ පවතින මහවැලිනිවාස උප-වැඩසටහන එච්.බී. හා සී කලාපයන්හි නිවාස 5,968 ක වැඩකටයුතු නිම කරමින් සැලකිය යුතු ප්‍රගතියක් දක්වන ලදී.

පෞද්ගලික අංශයේ නිවාස සංවර්ධන කටයුතු සඳහා පසුගිය වසරේ මෙන්ම ප්‍රධාන බැංකු හා මූල්‍ය ආයතන ස්වකීය ණය ක්‍රම පවත්වාගෙන යන ලදී. ලංකා බැංකුව, මහජන බැංකුව, රාජ්‍ය උකස් බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව හා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, නිවාස පහළොස් ලක්‍ෂයේ වැඩසටහන යටතේ පෞද්ගලික අංශයේ නිවාස සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය පහසුකම් සැපයූ ප්‍රධාන ආයතනයන් විය. 1992 වසරේ නිවාස ණය සැපයීම සම්බන්ධයෙන් ප්‍රමුඛස්ථානයක් දරන ලද්දේ ලංකා බැංකුවය. ලංකා බැංකුව විසින් සපයන ලද ණය ප්‍රමාණය පසුගිය වසරට වඩා සියයට 20 කින් වැඩිවී 2,306 ක්වූ අතර, ඒ සඳහා මුදා හරින ලද ණය ප්‍රමාණය සියයට 3 කින් වැඩිවී රුපියල් දශ ලක්‍ෂ 710 ක් විය. මහජන බැංකුවද 1991 දී පුද්ගලයින් 11,507 ක් වෙනුවෙන් සැපයූ රුපියල් දශ ලක්‍ෂ 384 ක ණය මුදල වෙනුවට 1992 දී පුද්ගලයින් 12,983 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්‍ෂ 514 ක ණය මුදලක් සපයන ලදී. මේ අතර රාජ්‍ය උකස් බැංකුව සැපයූ ණය පසුගිය වසරට වඩා සියයට 43 ක් වැඩිවී පුද්ගලයින් 1,978 ක් සඳහා රුපියල් දශ ලක්‍ෂ 301 ක මුදලක් ලබාදෙන ලදී. සලකා බලන වර්ෂය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුව ඉල්ලුම්කරුවන් 728 දෙනෙකු සඳහා රුපියල් දශ ලක්‍ෂ 97 ක ණය මුදලක් ප්‍රදානය කළ අතර, මෙය පසුගිය වසරේ ඉල්ලුම්කරුවන් 565 දෙනා හා සැපයූ මුදල වූ රුපියල් දශ ලක්‍ෂ 66 හා සැසඳේ. මේ අතර නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව එහි ආරම්භයේ පටන් මෙතෙක් එක් වසරක් තුළ අනුමත කල ඉහළම නිවාස ණය ප්‍රමාණයක් වාර්තා කරමින් ඉල්ලුම්කරුවන් 1,520 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්‍ෂ 100 ක මුදලක් අනුමත කළේය. තවද සලකා බලන වර්ෂය තුළදී පෞද්ගලික අංශයේ නිවාස සංවර්ධන කටයුතු සඳහා සමුපකාර ග්‍රාමීය බැංකු හා සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති ද සිය මූල්‍ය පහසුකම් පුළුල් කරන ලදී.

## නාගරික සංවර්ධනය

1992 දී නාගරික සංවර්ධන අධිකාරය (නා.සං.අ.) මගින් කරනු ලැබූ කටයුතුවල සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණි. නාගරික සංවර්ධන කටයුතු සඳහා කරන ලද මුළු ආයෝජන ප්‍රමාණය 1991 දී රුපියල් දශ ලක්‍ෂ 1,184 සිට 1992 දී රුපියල් දශ ලක්‍ෂ 338 දක්වා පහත වැටුණේය. 1991 දී ඉහළ මට්ටමක පැවති පිරිවැයට විශාල වශයෙන් හේතු වූයේ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදි කිරීමේ ව්‍යාපෘතියයි. වසර තුළදී කරන ලද මුළු වියදමින් රුපියල් දශ ලක්‍ෂ 124 ක් හෙවත් තුනෙක් එකක් ඒකාබද්ධ ව්‍යාපෘතීන් සඳහා වියදම් කරනු ලැබිණි. ඒකාබද්ධ ව්‍යාපෘතීන් යටතේ, පැලියගොඩ ගබඩා සංකීර්ණයක් තැනීම පිණිස රුපියල් දශ ලක්‍ෂ 86 ක් වැය කළේය. රුපියල් දශ ලක්‍ෂ 118 ක තවත් මුදල් ප්‍රමාණයක් අනුග්‍රාහකයන් වෙනුවෙන් භාරගත් ව්‍යාපෘති සඳහා වැය කළේය. මේ අතර, නා.සං.අ. හි ඉඩම් බැංකුව විසින් සංවර්ධනය නොකරන ලද හෝ මුඩු බිම් මිලදී ගැනීම සඳහා රුපියල් දශ ලක්‍ෂ 68 ක් වැය කරනු ලැබිණි.

## මහාමාර්ග සහ දුම්රිය මාර්ග

1992 දී මාර්ග සංවර්ධන අධිකාරිය (මා.සං.අ.) එහි මාර්ග පද්ධතිය කිලෝමීටර් 10,855 දක්වා කිලෝ මීටර් 276 කින් වැඩි කළේය. මා.සං.අ. මගින් නඩත්තු කල පාලම් සංඛ්‍යාව 3,760 කි. මේ අතර, මාර්ග ඉදිකිරීම සඳහා වූ මුළු ආයෝජන වියදම රුපියල් දශ ලක්‍ෂ 1,236 ක්වූ අතර මාර්ග නඩත්තුව සඳහා වූ වියදම රුපියල් දශ ලක්‍ෂ 171 ක් විය.

සලකා බලන වර්ෂය තුළදී, මා.සං.අ. හි මාර්ග පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම් කටයුතු නොකඩවා කරගෙන යනු ලැබිණි. අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමලය මාර්ග අඹේපුස්සේ සිට හබරණ දක්වාද, නුවර-යාපනය මාර්ගය මාතලේ සිට ගල්කුලම දක්වා සහ ගල්කුලම සිට අනුරාධපුරය දක්වාද වැඩිදියුණු කිරීම පිණිස වූ ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද ප්‍රථම මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි වැඩකටයුතු 1992 අවසානයේදී නිම විය. කිලෝ මීටර් 145 ක් පුනරුත්ථාපනය කිරීම පිණිස, ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලැබූ දෙවන මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි වැඩ කටයුතු 1992 වසර තුළදී ද නොකඩවා කෙරුණි. මීට අමතරව, මාර්ග කිලෝ මීටර් 176 ක් පුනරුත්ථාපනය කිරීම පිණිස ජාතයන්තර සංවර්ධන සංගමය විසින් අරමුදල් සපයනු ලැබූ තුන්වෙනි මාර්ග ව්‍යාපෘතියෙහි වැඩකටයුතු සලකා බලන වසර තුළදී ආරම්භ විය. මේ අතර, එගොඩඋයන හරහා මොරටුව සිට පානදුරය දක්වා වූ ද්විත්ව ගමන් මාර්ගයෙහි ඉදිකිරීම් කටයුතු අවසාන කල අතර, ගාලු පාරෙහි කළුතර සිට කොළඹ දක්වා වූ දැනට පවත්නා ගමන් මඟ වෙනුවට භාවිතා කළහැකි වස්කඩුව-බණ්ඩාරගම-කැස්බෑව මාර්ගය වැඩිදියුණු කිරීම් වැඩකටයුතු 1992 වසරෙහිදී නොකඩවා කරගෙන යනු ලැබිණි.

පසුගිය වර්ෂයේදී මෙන්ම, 1992 වර්ෂයේදීද දුම්රිය මාර්ග පද්ධතිය කිලෝ මීටර් 1,944 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. කෙසේ වෙතත්, ගාල්ල සිට මහනුවර දක්වා සහ රාගම සිට මීගමු දක්වා වූ දුම්රිය මාර්ග පුනරුත්ථාපන කිරීම් සඳහා වූ වැඩපිළිවෙලෙහි මූලික කටයුතු වසර තුළදී අවසාන කරනු ලැබිණි. මේ අතර, නුගේගොඩ සිට හෝමාගම දක්වා කැළණි වැලි දුම්රිය මාර්ගය පුළුල් කිරීමේ කටයුතු එහි දෙවන අදියර යටතේ 1992 දී ආරම්භ විය.

## පණිවුඩ හුවමාරුව

1992 වර්ෂයේදී, තැපැල් හා විදුලි සංදේශ අංශයේ, ධාරිතාව සහ ජනතාවට සලසන ලද සේවය අනුව තරමක වර්ධනයක් වාර්තා විය.

දිවයිනේ තැපැල් කාර්යාල පද්ධතිය පසුගිය වසරේ පැවැති සංඛ්‍යාව වූ 3,982 සිට 1992 දී 4,018 දක්වා පුළුල් විය. මේ අනුව, එක් තැපැල් කාර්යාලයකින් සේවාව සපයන ලද භූමි ප්‍රමාණය 1991 පැවැති වර්ග කිලෝමීටර් 16.5 සිට 1992 දී වර්ග කිලෝමීටර් 16.3 දක්වා අඩුවෙමින් ජනතාවට ඇති තැපැල් පහසුකම් වල දියුණුවක් පෙන්නුම් කෙරිණ. මේ අතර එක් පුද්ගලයකුට ලැබෙන ලිපිවල සාමාන්‍යය පසුගිය වසරේ සංඛ්‍යාව වූ 28 සිට 1992 දී 25 දක්වා අඩුවිය. තැපැල් දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන ලද තැපැල් භාණ්ඩ සංඛ්‍යාව 1991 දී වූ දශලක්ෂ 518 සිට 1992 දී දශලක්ෂ 469 දක්වා සියයට 10 කින් අඩුවිණි. මෙයට ප්‍රධානතම හේතුව වූයේ, දේශීය තැපැල් මෙහෙයුම, 1992 වසරේදී දශලක්ෂ 398 දක්වා සියයට 11 කින් අඩුවීමයි. මේ අතර එතෙර තැපැල් මෙහෙයුමද ඉතා සුළු වශයෙන් අඩුවී දශලක්ෂ 70 ක් ලෙස වාර්තා වුණි. එමෙන්ම දේශිය හා විදේශීය පාර්සල් මෙහෙයුම්ද පිළිවෙලින් සියයට 1 කින් හා සියයට 3 කින් පහත වැටුණි.

විදුලි සංදේශ දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන ගිය විදුලි සංදේශ කටයුතු ශ්‍රී ලංකා ටෙලිකොම් සංස්ථාවට පවරා ගැනීමෙන් අනතුරුව, විමසුමට ලක්වන වසරේදී එහි කටයුතුවල ප්‍රගතියක් දක්නට ලැබිණි. විදුලි සංදේශ කටයුතු පුළුල් කිරීම, තත්ත්වය ඉහළ නැංවීම හා දැනට පවතින විදුලි සංදේශ පද්ධතිය පුනරුත්ථාපනය කිරීමේ මූලික පරමාර්ථය ඇතිව 1992 වසරේදී ව්‍යාපෘති කීපයක් ක්‍රියාත්මක විය. මෙයින් වර්ෂය තුළ ක්‍රියාත්මක වූ ප්‍රධානතම ව්‍යාපෘති වූයේ, විදුලි සංදේශ සේවාවේ සාමාන්‍ය සංවර්ධන යෝජනාක්‍රමය, ලෝක ව්‍යාප්ත වාණිජමය පණිවුඩ හුවමාරු චන්ද්‍රිකා පද්ධතිය සඳහා ප්‍රාග්ධන දායකත්ව, විදේශ පණිවුඩ හුවමාරු සේවාව, විදේශ විදුලි සංදේශ සේවාව, අග්නිදිග ආසියා මැදපෙරදිග බටහිර යුරෝපා සබ්මැරීන් කේබල් යෝජනා ක්‍රමය, මාතර දිස්ත්‍රික් විදුලි සංදේශ පද්ධති සංවර්ධනය සහ ජාත්‍යන්තර සුවිච්ගත මධ්‍යස්ථානයක් හා පෘථිවිගත දුරස්ථ හුවමාරු පද්ධතියකින් යුත් දෙවන විදුලි සංදේශ ව්‍යාපෘතියයි.

## 1.28 සංඛ්‍යා සටහන
## තැපැල් සහ විදුලි සංදේශ සේවාවේ වර්ධනය 1989 - 1992

| ශීර්ෂය | 1989 | 1990 | 1991 | 1992* |
|---|---|---|---|---|
| 1. තැපැල් සේවය | | | | |
| 1.1 තැපැල් බෙදීමේ කොට්ඨාශ ගණන | 6,630 | 6,636 | 6,729 | 6,729 |
| 1.2 තැපැල් කාර්යාලයකින් සේවාව ලබන ප්‍රදේශය (ව.කි.මී) | 16.8 | 16.6 | 16.5 | 16.3 |
| 1.3 තැපැල් කාර්යාල සංඛ්‍යාව | 3,908 | 3,945 | 3,982 | 4,018 |
| 1.3.1 රාජ්‍ය අංශය | 3,841 | 3,864 | 3,884 | 3,891 |
| 1.3.2 පෞද්ගලික අංශය | 67 | 81 | 98 | 127 |
| 1.4 තැපැල් කාර්යාලයකින් සේවාව ලබන ජන සංඛ්‍යාව | 4,300 | 4,307 | 4,331 | 4,331 |
| 1.5 එක් පදිංචිකරුවකුට ලැබුණු ලිපි ගණන | 28 | 29 | 28 | 25 |
| 2. විදුලි සංදේශ සේවය | | | | |
| 2.1 දේශීය දුරකථන සේවය | | | | |
| 2.1.1 දුරකථන සංඛ්‍යාව | 105,007 | 121,388 | 125,834 | 135,398 |
| 2,1.2 අළුතින් දෙනු ලැබූ දුරකථන සංඛ්‍යාව | 6,087 | 20,226 | 6,579 | 10,607 |
| 2.1.3 පොරොත්තු ලේඛනයේ සිටින ගණන | 48,400 | 47,945 | 61,313 | 96,207 |
| 2.1.4 දුරකථන සඳහා ඉල්ලුම | 153,407 | 169,333 | 187,147 | 231,605 |
| 2.1.5 දුරකථන ඝනත්වය (පුද්ගලයින් 100 කට දුරකථන ගණන) | 0.62 | 0.71 | 0.73 | 0.78 |
| 2.2 විදේශ විදුලි සංදේශ සේවය | | | | |
| 2.2.1 ටෙලෙක්ස් සම්බන්ධක ගණන | 1,591 | 1,666 | 1,740 | 1,583 |
| 2.2.2 පොරොත්තු ලේඛනයේ සිටින ගණන | 59 | 89 | 84 | 103 |
| 2.2.3 එතෙර ඇමතුම් | | | | |
| 2.2.3.1 එතෙර දුරකථන ඇමතුම් (අ) | 8,038,000 | 9,006,000 | 14,624,355 | 17,883,482 |
| 2.2.3.2 එතෙර විදුලි පණිවිඩ (ආ) | 3,023,000 | 2,720,000 | 2,348,803 | 2,497,552 |
| 2.2.3.3 එතෙර ටෙලෙක්ස් පණිවිඩ (අ) | 4,777,000 | 4,472,122 | 4,140,000 | 4,241,929 |

(අ) සංඛ්‍යා දැක්වෙන්නේ මිනිත්තු වලිනි
(ආ) සංඛ්‍යා දැක්වෙන්නේ වචන වලිනි
* තාවකාලිකයි

මූලයන් : තැපැල් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ටෙලිකොම්

දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා මෙම ප්‍රධාන සංවර්ධන යෝජනා ක්‍රම වලට අමතරව, වර්ෂය තුළදී, තවත් අන්තර් ව්‍යාපෘති කීපයක් හඳුනාගත් අතර, එම ව්‍යාපෘති වඩා කඩිනම් පදනමක් යටතේ සැලසුම්කර රටේ පවතින ක්ෂණික ඉල්ලුම සපුරාලීමටත්, සේවාවන්ගේ තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒමටත් යොදාගති. ඒ අනුව, වර්ෂය තුළදී නව දුරකථන 8,000 ක් සැපයීමට හැකිවන පරිදි නුගේගොඩ නගරයේ අංකිත හුවමාරු මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමේ කටයුතු කරගෙන යනු ලැබිණි. කොළඹ නගරයේ කඩිනම් වැඩපිළිවෙල යටතේ හැව්ලොක්ටවුම, කෝට්ටේ, රත්මලාන සහ මොරටුව යන නගරවල හුවමාරු ධාරිතාව ඉහළ නැංවීම සඳහා කෙරෙන වැඩකටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. ඊට අමතරව දිවයිනේ නගර කීපයක සෘජු දුරකථන සේවා සහිත නව විදුලි සංදේශ හුවමාරු මධ්‍යස්ථාන කීපයක් ස්ථාපිත කරන ලදී. මේ අතර, විමසුමට ලක්වන වර්ෂයේ ශ්‍රී ලංකා ටෙලිකොම් විසින් 'ශ්‍රී ලංකා සෙලියුලර් මොබයිල්' පද්ධතියක් හඳුන්වා දීමට අවශ්‍ය මූලික වැඩකටයුතු සම්පූර්ණ කළ අතර, ප්‍රථම වරට දුරකථන් කාඩ්පත් ක්‍රමයක් ද හඳුන්වා දෙන ලදී.

සලකා බලන වර්ෂයේ, විදුලි සංදේශ පහසුකම් සඳහා ඉල්ලුම තවදුරටත් තීව්‍ර විය. 1992 දී නව දුරකථන සඳහා අයදුම්කරුවන්ගේ ඉල්ලුම 96,207 දක්වා සියයට 58 කින් ඉහළ ගියද, 'ශ්‍රී ලංකා ටෙලිකොම්' මඟින් වර්ෂය තුළ සපයන ලද දුරකථන සංඛ්‍යාව 10,607 කට සීමා විය. කෙසේ වුවද, 1992 වසරේදී සපයන ලද නව දුරකථන සංඛ්‍යාව පසුගිය වසරේ සැපයූ ප්‍රමාණයට වඩා 4,028 කින් වැඩි විය. ඒ අනුව මහජනතාවට සපයන ලද මුළු දුරකථන සංඛ්‍යාව 1,35,398 දක්වා සියයට 8 කින් ඉහළ ගියේය. මේ අතර සලකා බලන වර්ෂයේ එතෙර දුරකථන මෙහෙයුම් සංඛ්‍යාව සියයට 22 කින් ඉහළ නැගුණි. එතෙර විදුලි පුවත් හා ටෙලෙක්ස් පණිවුඩ සංඛ්‍යාව පිළිවෙලින් සියයට 6 කින් හා සියයට 2 කින් වැඩිවුණි. කෙසේ වුවද, 1992 වසරේදී සපයන ලද ටෙලෙක්ස් සම්බන්ධක සංඛ්‍යාව 1,583 දක්වා සියයට 9 ක් අඩුවුණි.

ජනසවිය වැඩපිළිවෙල

ජනසවිය වැඩපිළිවෙල සඳහා තවත් පවුල් 1,01,882 ඇතුලත් කර ගනිමින් එහි තුන්වන වටයේ කටයුතු 1992 පෙබරවාරි මාසයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22ක් තුළ ක්‍රියාත්මක විණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක පවුල් 1,03,664 ක් ආවරණය කරමින් 1990 දෙසැම්බර් මාසයේ ආරම්භ කරන ලද ජනසවිය දෙවන වටයෙහි පාරිභෝජන ආධාරක වැඩපිළිවෙල 1992 දෙසැම්බර් මාසයේදී අවසන් කෙරිණ. 1991 සැප්තැම්බර් මස කටයුතු සම්පූර්ණ කළ ජනසවිය ප්‍රථම වටයෙන් මේ වනවිටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 28 ක පවුල් 1,21,000 කට සහන සලසා තිබුණි. මේ අනුව ජනසවිය වැඩපිළිවෙල යටතේ මේ දක්වා වට තුනෙන්ම සහන ලැබූ මුළු පවුල් සංඛ්‍යාව 3,26,546ක් විය.

සලකා බලන වර්ෂය තුළදී පළමුවන වටයේ ප්‍රතිලාභීන්ට වැඩසටහන ආරම්භයේ සැලසුම් කල පරිදි ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමේ මං පැදුනි. ඒ අනුව, 1991 වසර අවසානයේදී රු. 1,458 ක මාසික පාරිභෝජන ආධාර අත්හිටවනු ලැබූ පළමුවන වටයේ පවුල් 1,21,000 කට 1992 සැප්තැම්බර් මස සිට රු. 25,000/- මුහුණත වටිනාකමින් යුතු ප්‍රාග්ධන හිමිකම් සහතිකයක් ලබාගැනීමට හැකිවිය. මෙම සහතිකය ප්‍රතිලාභීන්ට රු. 25,000/- ක ප්‍රාග්ධන පදනමක් ලබා ගැනීමට උපකාරී වේ. එමෙන්ම එය ආරක්ෂණ බැඳුම්කරයක් ලෙස තැන්පත් කර ස්වයං රැකියා ව්‍යාපෘතියක් සඳහා රු. 25,000/- ක ණයක් බැංකුවකින් ලබාගැනීමටද ප්‍රයෝජනවත් වේ. මෙම සහතික වෙනුවෙන් එක් එක් ප්‍රතිලාභියා සඳහා මසකට රු. 250/- ක පොලියක් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබා ගැනීමටද හැකි වේ.

ජනසවිය ප්‍රතිලාභීන්ට පරිභෝජන ආධාර සැපයීම සඳහා 1992 වසරේදී දෙවන හා තෙවන වට වෙනුවෙන් වියදම් කල මුළු මුදල රුපියල් දශ ලක්ෂ 3,096 ලෙස ගණන් බලා ඇත. මෙම වැඩපිළිවෙලේ ආරම්භයේ සිට 1992 වසරේ අවසානය දක්වා දුගී ජනතාවගේ පරිභෝජන ආධාර කටයුතු සඳහා රුපියල් දශ ලක්ෂ 10,113 ක් වැය කර ඇත. ඒ අතරතුර, 1992 වසර අවසන් වනවිට පරිභෝජන දීමනා තුළින් ජනිත වූ මුළු ඉතිරිකිරීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,986 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

ජනසවිය වැඩපිළිවෙල යටතේ ඇතිවූ රැකියා ජනන අවස්ථා දුප්පත් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට උපකාරී වී ඇත. 1991 ඔක්තෝබර් මාසයේ අවසන් වූ පළමුවන වටය මගින් පවුල් 1,00,475 කට රැකියා අවස්ථා සැපයුන අතර, 1992 දෙසැම්බර් මස අවසන් වූ දෙවන වටය මගින් පවුල් 58,749 කට රැකියා අවස්ථා උදා කර දී ඇත. මෙම රැකියා අවස්ථා කෘෂිකර්මය, ධීවර නිමැවුම් කර්මාන්ත, වෙළඳ හා වාණිජ යන විවිධ අංශවල ජනනය වී ඇත.

වැඩසටහන් ආරම්භයේ පටන්ම ප්‍රතිලාභීන් සඳහා ආදායම් උත්පාදන මාර්ග ඇතිකර ගැනීමට හා ඒවා පවත්වා ගැනීමට සැලකිය යුතු ප්‍රමාණයක ණය පහසුකම් සපයා ඇත. පළමුවන වටයේදී පුද්ගලයන් 73,103 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 625 ක් ණය ප්‍රදානය කර ඇති අතර දෙවන වටයේදී පුද්ගලයින් 33,820 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 322 ක ණය මුදලක් ලබාදී ඇත. මේ අතර, තුන්වන වටයේදී ජනසවි ප්‍රතිලාභීන් 13,153 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 85 ක ණය මුදලක් ප්‍රදානය කෙරුණි. ඉහත දැක්වූ ණය ප්‍රදානය කල ප්‍රධානතම බැංකු වශයෙන් ලංකා බැංකුව, මහජන බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සැලකිය හැකිය. ඊට අමතරව 1991 පිහිට වූ 'ජනසවිය භාරකාර අරමුදල' ජනසවි ප්‍රතිලාභීන් සඳහා මූල්‍ය පහසුකම් සපයමින් වැදගත් කාර්ය භාරයක් ඉටුකර ඇත. 1992 වසරේදී 'ජනසවි භාරකාර අරමුදල' මගින් ජන සමූහ සංවර්ධනය, පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම, මිනිස් සම්පත් සංවර්ධනය හා ආයතනික සංවර්ධන වැඩපිළිවෙලවල් සඳහා ණය පහසුකම් සැපයීම සඳහා රුපියල් දශ ලක්ෂ 74 ක් වැයකර ඇත.

### සෞඛ්‍යය

සෞඛ්‍ය සේවාවන් සඳහා වූ මුළු වියදම 1991 දී රුපියල් දශ ලක්ෂ 5,230 සිට 1992 දී රුපියල් දශ ලක්ෂ 6,591 දක්වා වැඩිවිය. මෙය පසුගිය වසරට වඩා සියයට 26 ක වැඩිවීමකි. ඒ අනුව මුළු රජයේ වියදමෙන් එයට අදාල කොටස 1991 දී සියයට 4.5 සිට 1992 දී සියයට 5.4 දක්වා වැඩිවිය. සෞඛ්‍ය සඳහා වූ වර්තන වියදම සියයට 11 කින් වැඩිවී

1.29 සංඛ්‍යා සටහන
සෞඛ්‍ය සේවය 1988 - 1992

| ශීර්ෂය | 1988 | 1989 | 1990 | 1991 | 1992* |
|---|---|---|---|---|---|
| 1. ආරෝග්‍යශාලා (බටහිර වෛද්‍ය සේවය) | 498 | 502 | 502 (ආ) | 504 (ආ) | 504 |
| 2. ඇඳන් ගණන | 45,406 | 46,620 | 42,079 (ආ) | 42,437 (ආ) | ලැ.නො. (ආ) |
| 3. මධ්‍යම බෙහෙත් ශාලා | 350 | 361 | 278 (අ) | 275 | 275 |
| 4. මුළු වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 2,316 | 2,456 | 2,440 (අ) | 2,934 | 2,824 |
| 5. මුළු සහකාර වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 1,100 | 1,193 | 1,074 | 1,201 | 1,265 |
| 6. මුළු ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 12,957 | 13,076 | 13,284 (අ) | 12,852 | 13,131 |
| 7. මුළු හෙද සේවක සංඛ්‍යාව | 8,317 | 9,486 | 8,957 | 9,934 | 10,589 |
| 8. මුළු උපස්ථායක සංඛ්‍යාව | 6,019 | 6,030 | 5,707 (ආ) | 5,697 (ආ) | ලැ.නො. |
| 9. ප්‍රතිකාර ලත් අභ්‍යන්තර රෝගීන්ගේ සංඛ්‍යාව ('000) | 2,543 | 2,525 | 2,533 (ආ) | 2,629 (ආ) | ලැ.නො. |
| 10. බාහිර රෝගීන්ගේ සංඛ්‍යාව ('000) | 31,407 | 31,781 | 28,401 | 28,575 | ලැ.නො. |
| 11. මුළු ජංගම වියදම (රු.දශලක්ෂ) | 2,427 | 3,381 | 3,685 | 4,110 | 4,571 |
| 12. මුළු සෞඛ්‍ය වියදම (රු.දශලක්ෂ) | 3,931 | 4,639 | 4,963 | 5,230 | 6,591 |

(අ) උතුරු පලාත ඇතුලත් නැත.

(ආ) උතුරු හා නැගෙනහිර පලාත් ඇතුලත් නැත.
* තාවකාලිකයි

මූලයන්: සෞඛ්‍යය හා වනිතා කටයුතු අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

රුපියල් දශ ලක්ෂ 4,571 ක් වූ අතර, ප්‍රාග්ධන වියදම 1992 දී රුපියල් දශ ලක්ෂ 2,020 දක්වා සියයට 81 කින් වැඩිවිය.

සලකා බලන වර්ෂය තුළදී, ජනාධිපතිතුමා විසින් පත් කෙරුනු මෙහෙයුම් ඒකකයක් විසින් වසර 2000 වන විට ලඟා කර ගතයුතු ඇතැම් අරමුණු හා ඉලක්කයන් විදහා දක්වන ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියක් සම්පාදනය කරනු ලැබිණි. මේ අනුව සෞඛ්‍ය ප්‍රතිපත්තියෙහි මූලික අරමුණ කේන්ද්‍ර කරගනු ලැබුයේ සෞඛ්‍ය කටයුතු නංවාලීම හා රෝග වැලැක්වීම, පවත්නා සේවාවන් හා ඒවායෙහි ගුණාත්මක බව ශක්තිමත් කිරීම, සෞඛ්‍ය පරිපාලනය විමධ්‍යගත කිරීම ආදී කටයුතුය. මේ අතර, වසර තුළදී සෞඛ්‍ය පොදු කාර්ය පහසුකම් සඳහා වූ ආයෝජන තවදුරටත් පුළුල් කරනු ලැබිණි. ලෝක බැංකුව/ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා.සං.සං.) මගින් අරමුදල් සපයනු ලැබූ සෞඛ්‍ය සහ පවුල් සංවිධාන ව්‍යාපෘතිය යටතේ ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන 63 ක්ද, රෝහල් බෙහෙත් ගබඩා සහ ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථාන කීපයක්ද ඉදි කරනු ලැබිණි. රාගම අංශයෙහි වාට්ටු කීපයක් ඉදිකිරීම සහ ජල සැපයීම් හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ යෝජනාක්‍රම වලින් සමන්විත කොළඹ මහ රෝහල සංවර්ධනය කිරීමේ දෙවන අදියර 1992 දී ආරම්භ විය. මේ අතර ජපන් ජාත්‍යන්තර සාමූහික නියෝජ්‍යායතනය (ජයිකා) විසින් මුදල් සපයනු ලැබූ ජීව-වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය පුනරුත්ථාපනය කිරීමේ වැඩකටයුතු 1992 මැයි මස ආරම්භ විය.

1992 දී දේශීය වෛද්‍ය ක්‍රම නඟා සිටුවීම පිණිස පියවර කීපයක්ම ගනු ලැබිණි. අක්ෂි රෝග, සර්පයින් දෂ්ඨ කිරීම සහ පිලිස්සීම් සඳහා ප්‍රතිකාර කිරීම සම්බන්ධව විශේෂ වෛද්‍ය සායන පැවැත්වීම, යුනානි ප්‍රතිකාර අංශයක් සහ කටු චිකිත්සා ප්‍රතිකාර අංශයක් පිහිටුවීම වැනි කටයුතු තුලින් බොරැල්ලේ ආයුර්වේද රෝහලින් සපයනු ලැබූ සේවාවන් තවදුරටත් පුළුල් කරනු ලැබිණි. මේ අතර, හල්දුම්මුල්ල, ගිරාදුරුකෝට්ටේ සහ පට්ටිපොල යන ස්ථානයන්හි බෙහෙත් පැලෑටි වගාවන් තවදුරටත් ව්‍යාප්ත කරන ලදී.

1992 දී ආයුර්වේද රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලා 137 කින් බාහිර රෝගීන් දශ ලක්ෂ 1.5 කටද, නේවාසික රෝගීන් 17,685 කටද සෞඛ්‍ය පහසුකම් ලබා දෙනු ලැබිණි. මීට අමතරව, පලාත් පාලන අධිකාරයන් මගින් පාලනය කරන නිදහස් බෙහෙත් ශාලා 235 කින් රෝගීන් 7,47,963 කට ප්‍රතිකාර කරනු ලැබිණි.

අධ්‍යාපනය

අධ්‍යාපන කටයුතු සඳහා වූ රජයේ මුළු වියදම 1991 දී රුපියල් දශ ලක්ෂ 9,129 සිට 1992 දී රුපියල් දශ ලක්ෂ 9,664 දක්වා සියයට 6 කින් ඉහළ නැගුණි. මේ අනුව මුළු රජයේ වියදමෙහි එයට අදාල කොටස 1991 දී සියයට 7.8 සිට 1992 දී සියයට 8.0 දක්වා වැඩිවිය. අධ්‍යාපනය සඳහා වූ ප්‍රාග්ධන වියදම 1992 දී රුපියල් දශ ලක්ෂ 2,007 දක්වා සියයට 70 ක වැඩිවීමක් වාර්තා කරනු ලැබූ අතර, වර්තන වියදම 1992 දී රුපියල් දශ ලක්ෂ 7,657 දක්වා සියයට 4 කින් අඩුවිය. නොමිලයේ පාසැල් පොත් ලබාදීම, දිවා ආහාර වැඩපිළිවෙල සහ පාසැල් වාර ප්‍රවේශපත් ලබාදීම සඳහා වැය කල රුපියල් දශ ලක්ෂ 2,239 ක මුදලක් වර්තන වියදමෙහි ඇතුලත් වේ. පාසැල් සිසුන් අතර මන්දපෝෂණය අඩු කිරීමේ අරමුණින් යුතුව දිවා ආහාර වැඩපිළිවෙල ක්‍රියාත්මක කල අතර, පාසැල් සිසුන්ගේ දිනපතා පැමිණීම වැඩිකිරීම, නොමිලයේ පාසැල් පොත් සැපයීමේ අරමුණ විය. මෙම වැඩපිළිවෙලවල් දෙක යටතේ 1992 දී පාසැල් 10,588 ක දශ ලක්ෂ 4.3 ක් පාසැල් ශිෂ්‍යයින් ප්‍රතිලාභ අත්පත් කර ගති.

සාමාන්‍ය අධ්‍යාපනය යටතේ වූ පාසැල් සංඛ්‍යාව 1991 වර්ෂයේ 10,520 සිට 1992 වර්ෂයේ 10,588 දක්වා වැඩි විය. මුළු ශිෂ්‍ය සංඛ්‍යාවද 1991 දී 42,58,697 සිට 1992 දී 42,84,166 දක්වා වැඩිවිය. කෙසේ වෙතත් පාසැල් ශිෂ්‍ය අනුපාතය 1992 දී 405 ක් ලෙස නොවෙනස්ව පැවතුණේය. මේ අතර, සියළුම පාසැල්වල වූ ගුරුවරුන්ගේ මුළු සංඛ්‍යාව 1992 දී 1,82,597 දක්වා 5,366 කින් වැඩිවිය. මේ හේතුවෙන් සියළුම පාසැල්වල ගුරු-සිසු අනුපාතය 1991 දී 24.0 සිට 1992 දී 23.5 දක්වා යහපත් අතට හැරුණි.

සලකා බලන වර්ෂය තුළදී අධ්‍යාපන පරිපාලනය ශක්තිමත් කිරීම සහ විමධ්‍යගත කිරීම සඳහා පියවර කිහිපයක්ම ගනු ලැබිණි. පරිපාලනය ජනතාවඅතරට ගෙන යාමේ සංකල්පය අනුව අධ්‍යාපන කොට්ඨාශ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා සම ඉම් වන පරිදි නැවත බෙදා වෙන් කරන ලදී. මේ අනුව, 1992 දෙසැම්බර් අවසානය වනවිට නව අධ්‍යාපන කාර්යාල 272 ක් පිහිටුවනු ලැබිණි. ඵලදායී පොදු සහභාගිත්වය තුළින් පාසැල් පරිපාලනය වඩා ශක්තිමත් කිරීම පිණිස පාසැල් සංවර්ධන මණ්ඩල පිහිටුවීම සඳහා පියවර ගනු ලැබිණි. මේ අනුව, 1992 දෙසැම්බර් අවසානය වන විට මෙබඳු මණ්ඩල 9,962 ක් පිහිටුවා තිබුණි. මේ අතර, ග්‍රාමීය පාසැල් පද්ධතිය ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව විදේශීය වශයෙන් මුදල් සපයනු ලැබූ ව්‍යාපෘති 3 ක් සලකා බලන වසර තුළදී ක්‍රියාත්මක විය. ඒවා නම්, ප්‍රාථමික පාසැල් සංවර්ධන ව්‍යාපෘතිය, සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය සහ වැව්ලිකරයේ පාසැල් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතියයි.

**1.30 සංඛ්‍යා සටහන**
**සාමාන්‍ය අධ්‍යාපනය 1988 - 1992**

| ශීර්ෂය | 1988 | 1989 | 1990 | 1991 | 1992* |
|---|---|---|---|---|---|
| 1. මුළු පාසැල් සංඛ්‍යාව | 10,261 | 10,296 | 10,382 | 10,520 | 10,588 |
| 1.1 රජයේ මුළු පාසැල් සංඛ්‍යාව | 9,771 | 9,805 | 9,864 | 9,998 | 10,042 |
| 1.2 වෙනත් පාසැල් | 490 | 491 | 518 | 522 | 546 |
| 2. මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 4,058,843 | 4,179,520 | 4,232,356 | 4,258,697 | 4,284,166 |
| 2.1 රජයේ පාසැල් | 3,938,062 | 4,057,815 | 4,111,272 | 4,135,114 | 4,155,035 |
| 2.2 වෙනත් පාසැල් | 120,781 | 121,705 | 121,084 | 123,583 | 129,131 |
| 3. අළුතෙන් ඇතුලත් කර ගැනීම් | 394,960 | 396,748 | 387,314 | 388,315 | 358,808 |
| 4. මුළු ගුරුවරුන්ගේ සංඛ්‍යාව | 146,334 | 153,243 | 184,822 | 177,231 | 182,597 |
| 4.1 රජයේ ගුරුවරු | 140,061 | 146,997 | 178,333 | 170,735 | 175,682 |
| 4.2 වෙනත් | 6,273 | 6,246 | 6,489 | 6,496 | 6,915 |
| 5. ශිෂ්‍ය/ගුරු අනුපාතය | 27.74 | 27.27 | 22.89 | 24.03 | 23.46 |
| 6. අධ්‍යාපනය සඳහා වූ මුළු වර්තන වියදම (රු. දශලක්ෂ) | 5,371 | 6,612 | 8,529 | 7,951 | 7,657 |

* තාවකාලිකයි

මූලයන්: අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

## මහවැලි වැඩපිළිවෙල 1/

මහවැලි වැඩපිළිවෙල යටතේ ගැනෙන විවිධ කලාප වල ගොවි පවුල් සහ ගොවි නොවන පවුල් පදිංචි කරවීම ද, පොදු කායභී පහසුකම් සැපයීමේ වැඩකටයුතු ක්‍රියාත්මක කරවීම ද, කෘෂිකාර්මික සංවර්ධන වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම ද 1992 වර්ෂය තුළදී නොකඩවා ක්‍රියාත්මක කෙරුණි. 1992 වර්ෂය තුළදී මහවැලි වැඩපිළිවෙල සඳහා දරණ ලද මුළු වියදම රුපියල් දශ ලක්ෂ 2,232 ක් හෙවත් වසර තුළදී වෙන් කරනු ලැබූ මුළු මුදලින් සියයට 82 කට සමාන විය. මහවැලි වැඩපිළිවෙල යටතේ වැය කරන ලද මුළු මුදලෙන් දශ ලක්ෂ 1,152 ක් හෙවත් සියයට 52 ක් වැය කරන ලද්දේ විවිධ කලාපවල 'බී' කලාපය (රුපියල් දශ ලක්ෂ 365) 'සී' කලාපය (රුපියල් දශ ලක්ෂ 564) 'ජී' කලාපය (රුපියල් දශ ලක්ෂ 9) 'එච්' කලාපය (රුපියල් දශ ලක්ෂ 122) සහ 'එල්' කලාපය (රුපියල් දශ ලක්ෂ 92) සංවර්ධන කටයුතු සඳහාය.

---

1/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ලැබුණ තොරතුරු මත පදනම් වේ.

## 1.31 සංඛ්‍යා සටහන

### මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ පවුල් පදිංචි කිරීම.
### ("එච්" "සී" "බී" "ජී" සහ "එල්" කලාප)

පවුල් සංඛ්‍යාව

| වර්ෂය / ප්‍රදේශය | "එච්" | "සී" | "බී" | "ජී" | "එල්" | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1976 .. | 2,383 | - | - | - | - | 2,383 |
| 1977 .. | 3,141 | - | - | - | - | 3,141 |
| 1978 .. | 2,754 | - | - | - | - | 2,754 |
| 1979 .. | 5,290 | - | - | - | - | 5,290 |
| 1980 .. | 7,407 | - | - | - | - | 7,407 |
| 1981 .. | 2,389 | 2,777 | - | - | - | 5,166 |
| 1982 .. | 1,449 | 2,683 | 1,918 | - | - | 6,050 |
| 1983 .. | 1,077 | 1,988 | 1,938 | 1,319 | - | 6,322 |
| 1984 .. | 1,956 | 1,992 | 1,381 | 446 | - | 5,775 |
| 1985 .. | 44 | 823 | 3,423 | 1,045 | - | 5,335 |
| 1986 .. | 780 | 2,151 | 1,260 | 583 | - | 4,774 |
| 1987 .. | 182 | 1,407 | 857 | 274 | - | 2,720 |
| 1988 .. | 14 | 1,081 | 656 | 85 | 3,270 | 5,106 |
| 1989 .. | 9 | 1,008 | 324 | 1,305 | 94 | 2,740 |
| 1990 .. | 1,680 | 3,427 | 3,492 | 366 | - | 8,965 |
| 1991 .. | 1,151 | 3,240 | 1,468 | 126 | - | 5,985 |
| 1992 (අ) | 754 | 2,005 | 1,716 | 6 | - | 4,481 |
| එකතුව | 32,460 | 24,582 | 18,433 | 5,555 | 3,364 | 84,394 |

(අ) තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

සටහන : **1992 ට පෙර දත්තයන් සංශෝධිතයි.**

1992 වසර තුළදී, මහවැලි වැඩපිළිවෙල යටතේ, ගැනෙන ජල විදුලිබල ව්‍යාපෘතීන් 6 මගින් උත්පාදනය කරන ලද මුළු විදුලිබල ධාරිතාව (ගිගවොට් පැය 1,559) ක් විය. එය පසුගිය වර්‍ෂයේ උත්පාදනය කරන ලද මුළු විදුලිබල ප්‍රමාණයට වඩා සියයට 2 ක ඉහල මට්ටමකි. පසුගිය වසර සමඟ සසඳන කල කොත්මලේ (ගිගවොට් පැය 480) වික්ටෝරියා (ගිගවොට් පැය 588) යන විදුලිබල ව්‍යාපෘතීන්හි උත්පාදනය පිළිවෙලින් සියයට 38 කින් සහ සියයට 22 කින් වැඩිවූ අතර, රන්දෙනිගල (ගිගවොට් පැය 193) රන්ටැඹේ (ගිගවොට් පැය 126) සහ උකුවෙල (ගිගවොට් පැය 172) උත්පාදනය කළ විදුලිබල ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 30 කින්, සියයට 26 කින් සහ සියයට 11 කින් පහත වැටුණි. වර්‍ෂය තුළ බෝවතැන්න ජල විදුලි බලාගාරයෙහි විදුලි බලය උත්පාදනය නොකරන ලදි. 1992 වර්‍ෂය තුළදී මහවැලි වැඩපිළිවෙල තුළින් උත්පාදනය කරන ලද මුළු විදුලි බල ප්‍රමාණය ජාතික විදුලිබල සැපයුමෙන් සියයට 44 ප්‍රමාණයකට දායක විණි.

මහවැලි බල ප්‍රදේශය තුළ 1992 වර්‍ෂයේදී වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය සියයට 15 කින් අඩු වී හෙක්ටයාර 100,653 ක් විය. 1991/92 මහ කන්නයේදී හෙක්ටයාර 68,947 ක ප්‍රදේශයක් වගා කළ අතර, එය පසුගිය වසරෙහි අදාල කන්නය සමඟ සසඳන කල සියයට 1 ක වර්‍ධනයක් පෙන්වයි. එමෙන්ම පසුගිය වසර තුන තුළම යල කන්නයේ වගා කළ මුළු බිම් ප්‍රමාණයන්හි සැබෑ වර්‍ධනයක් පෙන්වුවද 1992 වර්‍ෂයේ යල කන්නයේ වගා කළ මුළු බිම් ප්‍රමාණය සියයට 37 කින් අඩු වී හෙක්ටයාර 31,706 ක් විණි.

## 1.32 සංඛ්‍යා සටහන
## මහවැලි සංවර්ධන වැඩපිළිවෙල යටතේ වගා කළ අළුත් ඉඩම් ප්‍රමාණය

හෙක්ටයාර

| ශීර්ෂය | මහ 1988/89 | යල 1989 | එකතුව 1989 | මහ 1989/90 | යල 1990 | එකතුව 1990 | මහ 1990/91 | යල 1991 | එකතුව 1991 | මහ 1991/92 (අ) | යල 1992 (අ) | එකතුව 1992 (අ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 'එච්' කලාපය | 22,897 | 3,767 | 26,664 | 30,362 | 10,874 | 41,236 | 31,385 | 19,806 | 51,191 | 31,931 | 4,312 | 36,243 |
| වී | 21,694 | 1,383 | 23,077 | 27,893 | 7,594 | 35,487 | 29,392 | 9,176 | 38,568 | 29,294 | 1,262 | 30,556 |
| අනෙකුත් බෝග | 1,203 | 2,384 | 3,587 | 2,469 | 3,280 | 5,749 | 1,993 | 10,630 | 12,623 | 2,637 | 3,050 | 5,687 |
| 'බී' කලාපය | 9,013 | 9,311 | 18,324 | 10,606 | 10,508 | 21,114 | 11,551 | 10,347 | 21,898 | 11,786 | 11,221 | 23,007 |
| වී | 8,688 | 8,691 | 17,379 | 10,207 | 9,721 | 19,928 | 10,912 | 9,837 | 20,749 | 11,175 | 10,624 | 21,799 |
| අනෙකුත් බෝග | 325 | 620 | 945 | 399 | 787 | 1,186 | 639 | 510 | 1,149 | 611 | 597 | 1,208 |
| 'සී' කලාපය | 13,136 | 12,919 | 26,055 | 17,374 | 14,718 | 32,092 | 19,026 | 15,687 | 34,713 | 18,599 | 15,934 | 34,533 |
| වී | 12,329 | 12,408 | 24,737 | 14,085 | 14,274 | 28,359 | 15,632 | 15,008 | 30,640 | 16,760 | 15,098 | 31,858 |
| අනෙකුත් බෝග | 807 | 511 | 1,318 | 3,289 | 444 | 3,733 | 3,394 | 679 | 4,073 | 1,839 | 836 | 2,675 |
| 'ජී' කලාපය | 4,403 | 3,467 | 7,870 | 4,749 | 4,532 | 9,281 | 5,063 | 4,668 | 9,731 | 5,180 | 174 | 5,354 |
| වී | 4,104 | 1,773 | 5,877 | 4,546 | 2,702 | 7,248 | 5,017 | 2,613 | 7,630 | 4,959 | 117 | 5,076 |
| අනෙකුත් බෝග | 299 | 1,694 | 1,993 | 203 | 1,830 | 2,033 | 46 | 2,055 | 2,101 | 221 | 57 | 278 |
| 'එල්' කලාපය | - | - | - | 545 | 453 | 998 | 1,071 | 152 | 1,223 | 1,451 | 65 | 1,516 |
| වී | - | - | - | 346 | 137 | 483 | 700 | 84 | 784 | 824 | - | 824 |
| අනෙකුත් බෝග | - | - | - | 199 | 316 | 515 | 371 | 68 | 439 | 627 | 65 | 692 |
| එකතුව | 49,449 | 29,464 | 78,913 | 63,636 | 41,085 | 104,721 | 68,096 | 50,660 | 118,756 | 68,947 | 31,706 | 100,653 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

## 1.33 සංඛ්‍යා සටහන

## තෝරා ගත් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා වූ වියදම

| ව්‍යාපෘතිය | ආධාර ලබාගත් මූලාශ්‍රය | මුළු විදේශ විනිමය ලැබීම් (දශ ලක්ෂ) | 1991 වියදම (රු. දශ ලක්ෂ) | 1992 වියදම (රු. දශලක්ෂ) | 1992 (අ.) අවසානය දක්වා සමුච්චිත වියදම (රු. දශලක්ෂ) |
|---|---|---|---|---|---|
| 1. කිරිඳිඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතිය - පියවර 1 | ඒ.ඩී.බී.<br>කේ.එෆ්.ඩබ්.<br>අයි.එෆ්.ඒ.ඩී.<br>අයි.එෆ්.ඒ.ඩී. | ඇ.එ.ජ.ඩො. 30.0<br>ඩොයිෂ් මාර්ක් 43.5<br>එස්.ඩී.ආර්. 5.5<br>ඇ.එ.ජ.ඩො 12.0 | 115 | 69 | 1,882 |
| 2. කිරිඳිඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතිය - පියවර 11 | ඒ.ඩී.බී. | එස්.ඩී.ආර් 22.2 | 62 | 101 | 486 |
| 3. නිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතිය - අදියර 11 | ප්‍රංශය | ෆ්‍රෑන්ක් 200.0 | 82 | .6 | 1,687 |
| 4. මිනිපේ - නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය | ජපානය | යෙන් 1,295.0 | 12 | 136 | 172 |
| 5. වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය | - | - - | 41 | 56 | 114 |
| 6. ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය | - | - - | - | 49 | 49 |

(අ) තාවකාලිකයි.

මූලය: වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

1992 වසර තුළදී මහවැලි බල ප්‍රදේශය තුළ වී වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 90,113 ක් දක්වා සියයට 8 කින් පහත වැටුණි. අතිකුත් බෝග වගා කළ මුළු බිම් ප්‍රමාණය ද සැළකිය යුතු ලෙස සියයට 48 කින් පහත වැටී හෙක්ටයාර 10,540 ක් විණි.

1991 වර්ෂය අවසානය දක්වා මහවැලි වැඩපිළිවෙල යටතේ පදිංචි කරවන ලද මුළු පවුල් සංඛ්‍යාව, සියයට 33 ක පසු බෑමක් පෙන්විය. එය තවදුරටත්, 1992 දී සියයට 25 කින් අඩු වී පවුල් 4,481 ක් විය. මින් පවුල් 2005 ක් 'සී' කලාපයේ ද, පවුල් 1,718 ක් 'බී' කලාපයේ ද පදිංචි කරවන ලදී. 1992 වර්ෂය අවසානය දක්වා, මහවැලි වැඩපිළිවෙල යටතේ, පදිංචි කරවන ලද මුළු පවුල් සංඛ්‍යාව, 84,394 කි.

## වෙනත් වාරිමාර්ග සංවර්ධනය

1992 වර්ෂයේදී වෙනත් වාරිමාර්ග සංවර්ධන වැඩ කටයුතු වලට ඇතුළත් වූ ව්‍යාපාර යටතේ, මහවැලි වැඩපිළිවෙල මගින් ආවරණය වන ප්‍රදේශ හැර අතිකුත් සියලුම ප්‍රදේශ වල දැනට පවත්නා වාරිමාර්ග යෝජනා ක්‍රම පුනරුත්ථාපනය කිරීම, නගා සිටුවීම සහ වඩා කාර්යක්ෂම වාරිමාර්ග කළමනාකරණ ක්‍රමයක් මගින්, ගොවි සංවිධාන යටතේ ගොවින් ගේ උපරිම ක්‍රියාකාරි සහභාගිත්වය ඇති කිරීම සඳහා අවධානය යොමු කරන ලදී.

සියලුම ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමවල වැඩ කටයුතු, එනම් කිරිදිඔය වාරිමාර්ග හා ජනාවාස ව්‍යාපෘතියේ පළමු සහ දෙවන අදියර, නිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතිය, මිනිපේ - නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය, ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සහ වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය 1992 වර්ෂය තුළදී නොකඩවා ක්‍රියාත්මක විය. මෙම වාරිමාර්ග ව්‍යාපෘතීන් වෙනුවෙන්, 1991 වර්ෂයේදී වැය කරන ලද මුළු මුදල වන රුපියල් දශ ලක්ෂ 312 සමඟ සසඳන විට 1992 වර්ෂයේදී දැරූ වියදම රුපියල් දශ ලක්ෂ 417 ක් විය.

කිරිදිඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතියෙහි පළමු පියවර 1992 මාර්තු මාසයේදී නිම කරන ලදී. 1992 වසර සඳහා දේශීය ජලසම්පාදන යෝජනා ක්‍රමයෙන් සියයට 60 ක් නිම කිරීමට අපේක්ෂා කරනු ලැබුව ද, වසර තුළදී එයින් සියයට 18 ක් පමණක් සම්පූර්ණ කරන ලදී. කිරිදිඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතියෙහි පළමු පියවර සඳහා රුපියල් දශ ලක්ෂ 69 වැය කළ අතර, එම ව්‍යාපෘතියෙහි දෙවන පියවර සඳහා රුපියල් දශලක්ෂ 101 ක් වියදම් කර තිබුණි. කිරිදිඔය වාරිමාර්ග සහ ජනාවාස යෝජනා ක්‍රමය මගින් පළමු සහ දෙවන පියවරයන් යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ අලුතින් ඉඩම් හෙක්ටයාර 9,120 කට වාරිමාර්ග ජලය සපයනු ලැබීය.

නිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතියේ දෙවන අදියරෙහි ඉතිරි වැඩ කොටසින් හෙක්ටයාර 150 කට ජලය අපවාහන පහසුකම් ඇති කරන ලදී. මෙම ව්‍යාපෘතියෙහි 1992 වසරට රුපියල් දශ ලක්ෂ 6 ක් වියදම් විය. මිනිපේ - නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ රුපියල් දශ ලක්ෂ 136 ක් මෙම වර්ෂය තුළ දී වියදම් කර තිබුණි. වයඹ පලාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය සහ ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා වර්ෂය තුළ දී වැය වූ මුදල පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 56 ක් සහ රුපියල් දශ ලක්ෂ 49 ක් විය. වයඹ පලාතේ විශේෂ වාරිමාර්ග යෝජනා ක්‍රම 10 න් 7 ක් 1992 වසරේදී සම්පූර්ණ කරණ ලදී.

## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල

ආර්ථික හැකියාවන් වැඩි දියුණු කිරීම, ග්‍රාමීය ප්‍රදේශ වල සාමාන්‍ය ජීවන තත්ත්වය දිස්ත්‍රික්ක අතර හා දිස්ත්‍රික්ක වල නැංවීම සහ තුලිත වර්ධනයක් ඇති කිරීම තුළින් විෂමතා අඩු කිරීම 1979 වර්ෂයේ ආරම්භ කරන ලද ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙලේ ප්‍රධාන අරමුණුය.

## 1.34 සංඛ්‍යා සටහන
## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල - දිස්ත්‍රික්ක අනුව වියදම
## 1991 - 1992

රුපියල් දශලක්ෂ

| දිස්ත්‍රික්කය/ව්‍යාපෘතිය (අ) | විදේශාධාර මූලාශ්‍රය | ගණන් බලන ලද වියදම | | | සමුච්චිත වියදම | | වියදම | |
|---|---|---|---|---|---|---|---|---|
| | | විදේශීය | දේශීය | එකතුව | 1991 වර්ෂය අවසානය දක්වා | 1992 වර්ෂය අවසානය දක්වා (ආ) | 1991 වර්ෂය තුලදී | 1992 වර්ෂය තුලදී (ආ) |
| 1. මාතර (1979) | සීඩා (ස්වීඩනය) | 338 | 37 | 375 | 308 | 375 | 66 | 67 |
| 2. හම්බන්තොට (1979) | නෝරාඩ් (නෝර්වේ) | 766 | 18 | 784 | 685 | 769 | 108 | 84 |
| 3. නුවරඑළිය (1979) | නෙදර්ලන්තය | 510 | 10 | 520 | 391 | 447 | 42 | 57 |
| 4. බදුල්ල (1981) | කෘෂි. සං.ජා. අරමුදල සීඩා | 500 | 110 | 610 | 434 | 496 | 70 | 62 |
| 5. රත්නපුරය (1984) | නෙදර්ලන්තය | 263 | 5 | 268 | 197 | 241 | 39 | 44 |
| 6. මොණරාගල (1984) | නෝරාඩ් (නෝර්වේ) | 413 | 8 | 421 | 300 | 376 | 62 | 76 |
| 7. කෑගල්ල (1986) | කෘෂි සං.ජා. අරමුදල | 262 | 147 | 409 | 253 | 321 | 84 | 67 |
| 8. කළුතර (1987) | පිනිඩා (පින්ලන්තය) | 371 | 66 | 437 | 316 | 371 | 71 | 55 |
| 9. මහනුවර (1987) | ජර්මනිය | 120 | 4 | 124 | 30 | 55 | 10 | 25 |
| 10. ගම්පහ (1989) | ජපානය | 521 | 38 | 559 | 511 | 538 | 251 | 27 |
| 11. එස්.පී.ආර්.ඩී.පී. (1991) (ඇ) | ආසියානු සංවර්ධන බැංකුව | 1,520 | 400 | 1,920 | 11 | 42 | 11 | 31 |
| 12. අනුරාධපුර (1992) | සීඩා (ස්වීඩනය) | 5 | 44 | 49 | - | 9 | - | 8 |
| 13. ඒකාබද්ධ මූලික සේවා ව්‍යාපෘතිය (1992) | යුනිසෙෆ් | 106 | 53 | 159 | - | 27 | - | 27 |

(අ) ක්‍රියාත්මක කරන ලද වර්ෂය වරහන් තුළ දැක්වේ.
(ආ) තාවකාලිකයි.
(ඇ) එස්.පී.ආර්.ඩී.පී. දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය.

මූලයː ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය

වර්තමානයේදී ඒකාබද්ධ ග්‍රාමීය වැඩ පිළිවෙලට ඇතුළත් වන දිස්ත්‍රික්ක සංඛ්‍යාව 13 කි. 1981 වර්‍ෂයේ ආරම්භ කරන ලද මාතලේ දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල 1992 දී සම්පූර්ණ කරන ලදි. වර්ෂය තුළ නව ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල දෙකක් අරඹන ලදි. එනම්, සීඩා ආධාර ඇතිව ක්‍රියාත්මක වන අනුරාධපුර ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල සහ යුනිසෙෆ් ආධාර ඇතිව පුත්තලම් දිස්ත්‍රික්කයේ ආරම්භ කළ ඒකාබද්ධ මූලික සේවා ව්‍යාපෘති යන වැඩපිළිවෙලයි. ඒකාබද්ධ මූලික ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්කය වූයේ දිස්ත්‍රික්කය තුළ ජීවත්වන අඩු ආදායම් ලබන පවුල් වල පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීමයි. පසුගිය වර්‍ෂයේ වැය වූ රුපියල් දශ ලක්‍ෂ 814 සමඟ සසඳන විට 1992 දී මෙම වැඩ පිළිවෙලට වැය කළ මුළු මුදල රුපියල් දශ ලක්‍ෂ 631 ක් විය.